# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1716/5 - 2011 ජූලි 25 වැනි සඳුදා - 2011.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්කිරීම් ආදිය

ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර කළුවාදේවගේ නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වෛද්‍ය පී.ඩී.කේ. අධිකාරි මහතා, 2011.05.06 දින සිට 2011.05.20 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, වෛද්‍ය යූ. එස්. පී. උඩුනුවර මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. සී. හෙන්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.06.05 වැනි දින සිට 2011.07.02 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

03. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I වැනි පන්තියේ ඊ. එම්. සුමිත්‍රා ද සිල්වා මහත්මිය, 2011.06.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) වශයෙන්,

04. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II වැනි පන්තියේ ආර්. එස්. සී. ඩබ්. එම්. ඒ. බී. එන්. විජයතුංග මහතා, 2011.06.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වශයෙන්,

05. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I වැනි පන්තියේ ආර්. ඩී. සිරිපාල මහතා, 2011.06.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පුහුණු) වශයෙන්,

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. සී. හෙන්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.06.19 වැනි දින සිට 2011.06.25 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

1A - PG 001269—380 (2011/07)

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා 2010.02.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට,

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ එම්. ඒ. බී. දයා සෙනරත් මහතා 2011.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරි ඉටු කිරීමට,

09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික කේ. ඒ. පෙරේරා මහතා 2011.07.01 දින සිට මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.12.31 දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක්, ඌව පළාත් සභාවේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බල ශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ආර්. පී. කරුණාතිලක මහතා 2011.07.01 දින සිට මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.09.30 දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක්, ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ටී. බී. ඩබ්. චන්ද්‍රාණි ද සිල්වා මහත්මිය 2011.07.04 දින සිට මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.09.30 දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීමට,

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික කුසුම් පතිරාජ මහත්මිය 2011.07.01 දින සිට මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.12.31 දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

13. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වැනි පන්තියේ ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න මහතා 2011.07.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ වශයෙන්,

14. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වැනි පන්තියේ කේ. ඒ. බී. සෙනෙවිරත්න මහතා 2011.07.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ වශයෙන්,

15. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I වැනි පන්තියේ ආර්. එම්. නන්දසිරි මහතා 2011.03.23 වැනි දින සිට ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වශයෙන්,

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2011 ජූලි මස 18 වැනි දින,
බදුල්ල,
රජ වීදියේ පිහිටි,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

08-233

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.